# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 154 — 1975 මාර්තු 07 වැනි සිකුරාද — 1975.03.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම | 45 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන | 27 |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... | 49 | | |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන | 49 | විවිධ දැන්වීම | — |

සැළකිය යුතුයි.—(i) ශ්‍රී ලංකා සේවා මුක්ත භටයන්ගේ සංගමය පනත් කෙටුම්පත 1975 පෙබරවාරි 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 8 දරන මෝටර් ගමනා ගමන (සංශෝධන) පනත 1975 මාර්තු 7 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පලවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වා භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1974 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී.ඇම්. 7 දරන ෆෝර්ම මඟින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණේ අංකය : 32,977 ; (2) ලැබුණ දිනය : 1970 සැප්තැම්බර් මස 6 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : පාක් ඩේවිස් ඈන්ඩ් කම්පනි (ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් රාජ්‍යයේ නීති යටතේ සංවිධානය වූ සංස්ථාවකි) ඊවර්ට් ජෝසප් තැම්පෝ මාවත, ඩේට්‍රොයිට්, මිචිගන් 48232, ඇමරිකා එක්සත් ජනපදය : නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 3. (6) බඩු : ඩයිෆේනිල් හයිඩන්ටොයින් සහ එහි ලවණ අන්තර්ගත ඖෂධීය සම්මිශ්‍රණ ; (7) වෙළඳ ලකුණේ සටහන :

**DILANTIN**

ආර්. කොන්සල් කෝරලේ,
වැ. බ. වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 ඔක්තෝබර් මස 2 දින.

3-34/1 —75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 32,776 ; (2) ලැබුණ දිනය : 1970 ජූනි මස 28 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ඇම්කෙම් ප්‍රොඩක්ට්ස් ඉන්ක් (ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ, පෙන්සිල්වේනියා පොදු රාජ්‍ය මණ්ඩලයේ නීති යටතේ සංවිධානය වූ සංස්ථාවකි) බෲක්සයිඩ් මාවත, ඇම්බ්ලර්, පෙන සිල්වේනියාව, ඇමරිකා එක්සත් ජනපදය : රසායන ද්‍රව්‍ය නිෂ්පාදකයෝ ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 2. (6) බඩු : එතිලින් මෝචන වර්ගයේ පැලෑටිවල වැඩීම විධිමත් කරන කාරක ; (7) වෙළඳ ලකුණේ සටහන :

**ETHREL**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 ජූනි මස 24 දින.

3-34/2 —75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,133 ; (2) ලැබුණ දිනය : 1970 ඔක්තෝබර් මස 31 දින ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : රෙකිට් ඇන්ඩ් කෝල්මන් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් (බ්‍රිතාන්‍ය සමාගමකි) ඩැන්සම් පටුමග, හල්, යෝර්ක්ෂයර්, එංගලන්තය, නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ ; (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය ජූලියස් සහ ක්‍රිසි මහතුන්. තැ. පෙ. 154, කොළඹ ; (5) පන්තිය. 3 ; (6) බඩු : නිෂ්පෙෂණයෙන් භාවිතය පිණිස ඖෂධීය සම්මිශ්‍රණ ; (7) වෙළඳ ලකුණේ සටහන :

**REVIVON**


ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 නොවැම්බර් මස 12 දින.

3-34/3 —75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,472. (2) ලැබුන දිනය : 1971 අප්‍රේල් මස 16 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ඊමිටස්මා සිගරට්ටන් ෆැබ්‍රිකන් ජී. එම්. බී. එච්. (ජර්මනියේ නීති යටතේ සංවිධානයවූ බද්ධ ව්‍යාපාර වස්තු සමාගමකි) හැම්බර්ග්, පාක්ස්ට්‍රැබ් 51, බටහිර ජර්මනිය : නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 45. (6) බඩු : සියලුම වර්ගවල දුම්කොළ නිෂ්පාදන, විශේෂයෙන් සිගරට්. (7) වෙළඳ ලකුණේ සටහන :




(අ) මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් "Daniel" සහ "Walker" යන පෙළපත් නාම වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

ආ) මෙම වෙළඳ ලකුණ එහි නිරූපනයෙහි දැක්වෙන පාටවලට සීමා කෙරේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 පෙබරවාරි මස 28 දින.

3-30 —75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 32,136. (2) ලැබුණ දිනය : 1969 නොවැම්බර් මස 24 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : මැජික් චෙෆ්, ඉන්ක් (ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංස්ථාවකි) අංක 740, කිං එඩ්වර්ඩ් මාවත, එස්. ඊ. ක්ලෙව්ලන්ඩ්, ටෙනසි 37311, ඇමරිකා එක්සත් ජනපදය : නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන් තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 18. (6) බඩු : රත් කිරීමේ සහ පිසීමේ උපකරණ සහ ශීතන යන්ත්‍රස්ථාන සහ උපකරණ. (7) වෙළඳ ලකුණේ සටහන :

**MAGIC CHEF**

මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් "සායක අරක්කැමි" සළකුණ වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 මාර්තු මස 21 දින.

3-32 —75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 32,259. (2) ලැබුණ දිනය: 1970 ජනවාරි මස 3 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ඩොයිච් ගෙසල්ෂාෆ්ට් fපර් ෂඩ්ලිංග්ස් බෙකම්fජිංග් එම්බීඑච් (ජර්මනියේ නීති යටතේ සංවිධානයවූ බද්ධ ව්‍යාපාර වස්තු සමාගමකි) නෙවු මෙන්සර් ස්ට්‍රැසි 1, 6 fප්‍රැන්ක්fපර්ට් ඇම් මේන්, ජර්මනිය: නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 2. (6) බඩු: මාරක සතුන් සහ පැලෑටි මුලෝත්පාටනය කිරීම සඳහා සංයෝග, විෂබීජ සහ කුඩා ප්‍රාණීන් නාශක, විෂබීජ නැසීමේ සංයෝග. (7) වෙළඳ ලකුණේ සටහන:

**G A S T O X I D**

මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් 'GAS' සහ 'TOXIL' යන වචන වෙන වෙනම භාවිතය පිණිස තනි අයිතිය නොලැබේ.


ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 පෙබරවාරි 4 වැනිදා.

3-33—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 26,708. (2) ලැබුණ දිනය: 1965 අප්‍රේල් මස 21 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ක්‍රිස්ටිනස් කෝ. ජී. (ජර්මන් ජාතික, ආචාර්ය fජඩ්රික් ක්‍රිස්ටිනස් සහ මාරි-එලිසා බැච් මැතිණිය (විවාහයට පෙර පිටර්) හවුල්කරුවන් වන ජර්මන් සමූහාණ්ඩු ජනරජයේ නීති යටතේ ලියාපදිංචි කරන ලද, වගකීම සීමාසහිත හවුල් ව්‍යාපාරික සමාගමකි) 28 බ්‍රිමන් 1, ඩොඑච් ලින්ජර් ස්ට්‍රැසි 4, ජර්මනිය: නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 45. (6) බඩු: දුම්කොළ නිෂ්පාදන; (7) වෙළඳ ලකුණේ සටහන:




(අ) මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් 'P' 'E' යන ඉංග්‍රීසි හෝඩි අක්ෂර සහ ලකුණේ ඇතුලත් විස්තරාත්මක දෑ වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.


(ආ) මෙම වෙළඳ ලකුණ අංක 30,144 දරණ ලකුණ හා සමග ආශ්‍රිත කරනු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ඔක්තෝබර් මස 9 දින.

-31/1—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 33,006. (2) ලැබුණු දිනය: 1970 සැප්තැම්බර් මස 14 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) ගලහර් ලිමිටඩ් (මහා බ්‍රිතාන්‍ය එක්සත් රාජධානියේ සහ උතුරු අයර්ලන්තයේ නීති යටතේ සංවිධානයවූ සමාගමකි). වර්ජිනියා හවුස්, අංක 134/148 යෝර්ක් වීදිය, බෙල්fපස්ට්, උතුරු අයර්ලන්තය: නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ.පෙ. 154, කොළඹ. (5) පන්තිය: 45. (6) බඩු: සිගරට්. (7) වෙළඳ ලකුණේ සටහන:




මෙම වෙළඳ ලකුණු අංක 30,414 31,217 හා 31,234 දරණ වෙළඳ ලකුණු හා ආශ්‍රිත කරනු ලැබේ.

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 සැප්තැම්බර් මස 5 දින.

3-31/2—75.03.07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,881. (2) ලැබුණ දිනය: 1971 සැප්තැම්බර් මස 22 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): fපාබෙන් fපබ්‍රිකන් බේයර් ඇක්ටිඑන්ගෙසල් ෂාfට් (ජර්මන් සමූහාණ්ඩු ජනරජයේ නීති යටත් විධිමත්ව සංවිධානයවූ සමාගමකි.) ලිවර්කූසන්—බේයර්වර්ක්: බටහිර ජර්මනිය—නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ද සිල්වා සහ මැන්දිස් මහතුන්, තැ. පෙ. 884. කොළඹ. (5) පන්තිය: 3. (6) බඩු: මිනිස් ප්‍රයෝජනය පිණිස භෛෂජ්‍යක නිෂ්පාදන; (7) වෙළඳ ලකුණේ සටහන:

**G O N U B A L**

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 සැප්තැම්බර් මස 2 දින.

3-35—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය: 34,865. (2) ලැබුණ දිනය: 1972 දෙසැම්බර් මස 5 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): කුඩා විදානගේ ජස්ටින් ද සිල්වා (කේ. වී. ජී. ද සිල්වා ඇන්ඩ් සන්ස් යනුවෙන් ව්‍යාපාරික) අංක 415 ගාලු පාර, කොළඹ 4: පොත් අලෙවි කරන්නෝ, ප්‍රකාශකයෝ සහ සාමාන්‍ය වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ——. (5) පන්තිය: 39. (6) බඩු: පොත් සහ වාර සඟරා. (7) වෙළඳ ලකුණේ සටහන:



ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ඔක්තෝබර් මස 1 දින.

3-36—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,865. (2) ලැබුණ දිනය: 1970 ජූලි මස 26 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ද කොකා-කෝලා කම්පනි (ඩිලවෙයාර් රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංස්ථාවකි) මැඩිසන් මාවතේ අංක 515 දරණ ස්ථානයේ කාර්යාලය පිහිටි, නිව්යෝර්ක් නගරය, නිව්යෝර්ක් රාජ්‍යය 10022, ඇමරිකා එක්සත් ජනපදය: නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 42. (6) බඩු: වායු අමිශ්‍ර මද්‍යසාර රහිත පානවර්ග, පානවර්ග නිෂ්පාදනය පිණිස සම්මිශ්‍රණ වායු මිශ්‍ර හෝ නොවන. (7) වෙළඳ ලකුණේ සටහන:

**V E R V E**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 ජූලි මස 23 දින.

3-28/1—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,836. (2) ලැබුණ දිනය: 1971 අගෝස්තු මස 31 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ජොන්සන් ඇන්ඩ් ජොන්සන් (නිව් ජර්සි රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන ඇමරිකා එක්සත් ජනපද සමාගමකි) අංක 501, ජෝර්ජ් වීථිය, නිව් බෲන්ස්වික්, නිව් ජර්සිය. ඇමරිකා එක්සත් ජනපදය: නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 3. (6) බඩු: භෛෂජ්ජික සම්මිශ්‍රණ. (7) වෙළඳ ලකුණේ සටහන:

**B U T I B E L**

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 සැප්තැම්බර් මස 2 දින.

3-28/2—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,348. (2) ලැබුණ දිනය: 1971 පෙබරවාරි මස 20 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ඇන්ගොස්ටූයුරා බිටර්ස් (ආචාර්ය ජේ. ජී. බී. සීජර්ට් ඇන්ඩ් සන්ස්) ලිමිටඩ් (ට්‍රිනිඩෑඩ් රාජ්‍යයේ නීති යටතේ සංස්ථාපිත සමාගමකි) අංක 6 සහ 8, ජෝර්ජ් වීථිය, පෝට්, ඔෆ් ස්පේන්, ට්‍රිනිඩෑඩ්: තිත්තක නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 43. (6) බඩු: මද්‍යසාරීය තිත්තක. (7) වෙළඳ ලකුණේ සටහන:

**A N G O S T U R A**

මෙම වෙළඳ ලකුණ අංක 5,021, 6,168, 10,996, සහ 22,667 දරණ වෙළඳ ලකුණු හා ආශ්‍රිත කරනු ලැබේ.

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,

3-28/3—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,742. (2) ලැබුණ දිනය: 1971 ජූලි මස 24 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ද වෙල්කම් ෆවුන්ඩේෂන් ලිමිටඩ් (වගකීම සීමාසහිත බ්‍රිතාන්‍ය සමාගමකි), අංක 183/193, යූස්ටන් පාර, ලන්ඩනය, එන්. ඩබ්ලිව්. 1, එංගලන්තය. නිෂ්පාදන රසඥයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 3. (6) බඩු: භෛසජ්ජික සහ ඖෂධීය සම්මිශ්‍රණ සහ ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන:

**D A N I T I N A**

මෙම වෙළඳ ලකුණ අංක 33,743 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබුවහොත් හෝ ලැබූවිට එම ලකුණ හා සමග ආශ්‍රිත කරනු ලැබේ.

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 සැප්තැම්බර් මස 2 දින.

3-28/4—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,743. (2) ලැබුණ දිනය: 1971 ජූලි මස 24 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ද වෙල්කම් ෆවුන්ඩේෂන් ලිමිටඩ් (වගකීම සීමාසහිත බ්‍රිතාන්‍ය සමාගමකි) අංක 183/193, යූස්ටන් පාර, ලන්ඩනය එන්. ඩබ්ලිව්. 1; එංගලන්තය: නිෂ්පාදන රසඥයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ජූලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 3. (6) බඩු: භෛසජ්ජික සහ ඖෂධීය සම්මිශ්‍රණ සහ ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන:

**D A N A T A N**

මෙම වෙළඳ ලකුණ අංක 33,742 දරණ වෙළඳ ලකුණ ලියාපදිංචි කළ විට හෝ කළහොත් එම ලකුණ සමඟ ද ආශ්‍රිත කරනු ලැබේ.

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 සැප්තැම්බර් මස 2 දින.

3-28/5—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය : 31,570. (2) ලැබුණ දිනය : 1969 ජූනි මස 18 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : සීමන්ස්, ඇක්ටිඑන් ගෙසෙල්ෂාෆ්ට් (ජර්මන් සමාගමකි), විට්ල්. බැචර් ප්ලැට්ස් 2, 8000 මන්චන් 2, ජර්මනිය : නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය : 40. (6) බඩු : මැලියම්, රබර්, රබර් ආදේශක සහ වෙනත් පන්තිවල ඇතුළත් නොවන මේ ද්‍රව්‍යවලින් නිෂ්පාදිත භාණ්ඩ (සියල්ලම 40 වන පන්තියට අයත්වේ). (7) වෙළඳ ලකුණේ සටහන :

SIEMENS

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජූලි මස 19 දින.
3-29/1—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

(1) වෙළඳ ලකුණේ අංකය : 33,428. (2) ලැබුණ දිනය : 1971 මාර්තු මස 22 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : බ්‍රිටිෂ් ලේලන්ඩ් මෝටර් කෝර්පරේෂන් ලිමිටඩ් (බ්‍රිතාන්‍ය සමාගමකි), බර්ක්ලි ස්ක්වෙයාර් හවුස්, බර්ක්ලි ස්ක්වෙයාර්, ලන්ඩනය, එංගලන්තය : මෝටර් රථ නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ජූලියස් සහ ක්‍රිසි මහතුන්, තැ. පෙ. 154. කොළඹ. (5) පන්තිය : 22. (6) බඩු : මෝටර් ඉඩම් වාහන සහ ඒවායේ කොටස්. (7) වෙළඳ ලකුණේ සටහන :

මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් (L) අක්ෂරය වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1974 ජූනි මස 26 දින.
3-29/2—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

## වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන

**ශුද්ධියකි**

අංක 143 හා 1974 දෙසැම්බර් මස 20 වෙනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 35,334 හා 1973 ජූලි මස 26 වන දින දරණ 42 වන පන්තියේ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ අංක 4 පහත සඳහන් පරිදි නිදොස් විය යුතුය.

(4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය :

ඩී. එන්. තුරෙයිරාජා මයා.,
තැ. පෙ. 1464, කොළඹ.

ජේ. ඇලන් අයි. විජේකෝන්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1975 ජනවාරි 24 දින.
3-145—75. 03. 07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

## පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

**දැන්වීමයි**

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන ඇත :—

1968 දෙසැම්බර් මස 17 වෙනි දින දරණ අංක 6,280 (46 වෙනි වගන්තිය යටතේ 1963.12.17 දින දරණ අංක 992,168 දරණ එක්සත් රාජධානියේ පේටන්ට් බලපත්‍ර ලියා පදිංචිය)


සොසයිටේ ඩෙස් යුසිනිස් කිමිකිස් රෝන්—පෝලෙන්ක්.

" ඉමිඩසෝල් ව්‍යුත්පන්න නිෂ්පාදනය සඳහා වූ ක්‍රියාවලියක්. "


**සංක්ෂේපය.** :—

මෙම නව නිර්මාණයේ ස්වභාවය පහත කියැවෙන 1 දරණ හිමිකම් ප්‍රකාශනයෙන් නිශ්චය කරගත හැක :—

1–(2–හයිඩ්‍රොක්සිඑතිල්)–5–නයිට්‍රෝඉමිඩසෝල් නිෂ්පාදනය සඳහාවූ ක්‍රියාවලියේ පොදු සූත්‍රය :



(මෙහි R යන්නෙන් හයිඩ්‍රජන පරමාණුවක් හෝ පහ දක්වා කාබන් පරමාණු අඩංගු ඇල්කිල් කාණ්ඩයක්, හෝ ඇරිලයක්, ඇරල්කිල් හෝ ඇලිසයික්ලික් කාණ්ඩය නිරූපණය කෙරේ) නැතහොත් නයිට්‍රෝඉමිඩසෝල් සමඟ ප්‍රතික්‍රියාකාරී එතිලීන් ඔක්සයිඩ අඩංගු, ඒවායේ අම්ල ආකලන ලවන වන්නාවූ පොදු සූත්‍රය :



(මෙහි R යනු ඉහිත සඳහන් පරිදිමය) නයිට්‍රෝඉමිඩසෝල් සඳහා ද්‍රාවකයක් සහ නිදහස් මූලයක් හෝ අම්ල ආකලන ලවනයක ස්වභාවයෙන් යුත් ප්‍රතික්‍රියා මිශ්‍රණයකින් 1–(2–හයිඩ්‍රොක්සිඑතිල්)–5– නයිට්‍රෝඉමිඩසෝල් නිෂ්පාදනය ලබා ගන්නා කාබනික අම්ල යටත් පිරිසෙයින් එකක් අඩංගු වන්නා වූ නොහොත් ඇතුළත් ද්‍රව මාධ්‍යයක ද්‍රාවනයක් තුළ.

හිමිකම් ප්‍රකාශ 13 ක් සහ නිදර්ශන 6 ක් ඇත.

ආර්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

කොළඹ, 1973 මාර්තු 27 දින.

3–913—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

---

**දන්වීමයි**

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන ඇත :—

1968 නොවැම්බර් මස 23 වෙනි දින දරණ අංක 6,267 (46 වෙනි වගන්තිය යටතේ 66.8.16 දින හා අංක 1,085,340 දරණ එක්සත් රාජධානියේ පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය)


සාන්ඩෝස් ලිමිටඩ්

" නව පොස්පරික් සහ තියෝපොස්පරික් අම්ල විස්තර ව්‍යුත්පන්න "

**සංක්ෂේපය.—**


මෙම නව නිර්මානයේ ස්වභාවය පහත කියැවෙන 1 දරණ හිමිකම් ප්‍රකාශනයෙන් නිශ්චය කරගත හැක.

I දරණ සූත්‍රයේ සංයෝග නිෂ්පාදනය කිරිම සඳහා වූ ක්‍රියාවලියක්.




I

මෙහි $R_1$ යන්නෙන් —O— (ඇල්කිල් $C_1$ සිට $C_4$) නිරූපනය කෙරේ. $R_2$යන්නෙන් —O—(ඇල්කිල $C_1$ සිට $C_4$) හෝ—N(ඇල්කිල් $C_1$ සිට $C_4$)2, නිරූපනය කෙරේ. $R_3$ යන්නෙන් —H, — $CH_3$ — OH හෝ —COO (ඇල්කිල් $C_1$ සිට $C_4$) නිරූපනය කෙරේ. $R_4$යන්නෙන් —$CH_3$හැලජන පරමාණුවක් —$NO_2$හෝ—H නිරූපනය කෙරේ. Y යන්නෙන් S හෝ O ද n යන්නෙන් 1 සිට 4 දක්වා වූ සම්පූර්ණ සංඛ්‍යාවක් නිරූපනය කෙරේ. සංයෝගයෙහි ලක්ෂණය වන්නාවූ II දරණ සූත්‍රයේ සංයෝගය



II

මෙහි $R_3$, $R_4$සහ n හි ඉහළ දක්වෙන අර්ථයම ඇති අතර Z යනු කැටායනයක් වන අතර පහත් සඳහන් III දරණ සූත්‍රයේ සංයෝගයක් සමග ප්‍රතික්‍රියා කෙරේ.



III

මෙහි $R_1$, $R_2$ සහ Y යන්නෙන් ඉහළ අර්ථයම දක්වෙන අතර X යනු හැලජන පරමාණුවකි. තවද, Z යන්නෙන් හයිඩ්‍රජන පරමාණුවක් නිරූපනය කෙරෙන විට අම්ල බන්ධන කාරකයක් ඇතිව ප්‍රතික්‍රියාවක් සිදුවීමට යටත්වේ.

හිමිකම් ප්‍රකාශ 11ක්, නිදර්ශන 11ක් සහ චක්‍ර 3ක් ඇත.

ආර් එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

කොළඹ, 1972 නොවැම්බර් 17 දින.

3–287/1—75.03.07 දින අංක 154 දරන ගැසට් පත්‍රය

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන ඇත :—


1968 දෙසැම්බර් මස 2 දරණ අංක 6,269 (46 වැනි වගන්තිය යටතේ 64.3.19 දින හා අංක 1,010,582 දරණ එක්සත් රාජධානියේ පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය)

බෝරින්ගර් මැන්හෙයිම් ජීඇම්බීඑච්.

"නව නයිට්‍රොෆියුරිල් ව්‍යුත්පන්න"

**සංක්ෂේපය.—**

මෙම නව නිර්මානයේ ස්වභාවය පහත කියැවෙන 1 දරණ හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැක :—
නයිට්‍රෝෆියුරිල් ව්‍යුත්පන්නවල පොදු සූත්‍රය.




මෙහි R යනු හයිඩ්‍රජන පරමාණුවක් හෝ ඇල්කිල් ඛණ්ඩකයක් වන අතර Z යනු X හෝ 8 පත්වයේ විනිල් කාණ්ඩය සමග සම්බන්ධිත පිරිඩිල් ඛණ්ඩකයකි. එය පිරිඩිල් නෑෂ්ටියේ පෝලර් හෝ හයිඩ්‍රෝෆයිලික් ආදේශිකයන් එකක් හෝ වැඩි ගණනක් සහ චාතුර්ථ ඇමෝනියම් ලවන සහ ඒවායේ අම්ල ආකලන ලවනයක් උසුලයි.

හිමිකම් ප්‍රකාශ 29ක් සහ නිදර්ශන 17ක් ඇත.

කොළඹ, 1973 මැයි 9 දින,

ආර්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

3–287/2—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය


---

### දැන්වීමයි


පහත සඳහන් පිරිවිතර පිලිගෙන තිබේ :—

1968 දෙසැම්බර් 5 දින දරණ අංක 6,271 (46 වැනි ඡෙදය යටතේ 1964.03.03 දින හා අංක 1,051,686 දරණ එ.රා. පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම)
සැන්ඩෝ ලිමිටඩ්

"චක්‍රීය පොලිපෙප්ටයිඩ පිළිබඳව හෝ ඒවාට සම්බන්ධ වැඩිදියුණු කිරීම" උධෘතය.
උත්පාදනයේ ස්වභාවය පහත දක්වෙන 1 වන උරුම ප්‍රකාශයෙන් නිශ්චය කළ හැකිය :—
1 වන සූත්‍රයෙන් යුත් පොලිපෙප්ටයිඩයක් හා එහි අම්ල ආකලන ලවණ නිෂ්පාදනය කිරීම පිළිබඳ කාර්යාවලියකි.




ඊට PH 4–9 දක්වා වූ ප්‍රමාණයක ජලීය ද්‍රාවණයෙක පිහිටි V වන සූත්‍රයෙන් යුත් නන්ඇපප්ටයිඩ ඔක්සිකරණය ඇතුළත් වන අතර, අම්ල ආකලන ලවණයක් නිපදවීමට අවශ්‍ය වූ විට ඉහත දක්වූ පරිදි ලබාගත් 1 වන සංයෝගය කාබනික හෝ අකාබනික අම්ලයක් සමග ප්‍රතික්‍රියා කරනු ලැබේ.




උරුම ප්‍රකාශ 9ක් හා නිදර්ශන 2ක් ඇත්තේය.

1972 නොවැම්බර් 17 දින,
කොළඹ දිය.

ආර්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර පිළිබඳ රෙජිස්ට්‍රාර්.

3–287/3—75.03.07 දින අංක 154 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**
(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැළකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.10 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය,

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. | මිළ ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| පෙබරවාරි | 07.02.75 | සිකුරාද | 31.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.02.75 | සිකුරාද | 07.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.02.75 | සිකුරාද | 14.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 28.02.75 | සිකුරාද | 21.02.75 | සිකුරාද | දවල් 12.00 |
| මාර්තු | 07.03.75 | සිකුරාද | 28.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද | 07.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද | 14.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | 21.03.75 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද | 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද | 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද | 02.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද | 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද | 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද | 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද | 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද | 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද | 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී